# ශ්‍රී ලංකාවේ පෘතුගීසි අවධියට අයත් මැණික්කඩවර බලකොටුව පිළිබඳ අධ්‍යයනයක්

අයි.කේ.එස්. තිලකරත්න

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
sanjeewanit@gmail.com

ප්‍රමුඛ පදඃ පෘතුගිසි බලකොටුව ,පෘතුගීසි යුගය ,හමුදාව, කන්ද උඩරට

## හැඳින්වීම

වර්ෂ 1543 දි පෙර-පර දෙදිග එක් කළ යුරෝපයේ වෙළඳ මධ්‍යස්ථානය වූ කොන්ස්තන්තිනෝපල් නගරය අල්ලාගත් ඔටෝමාන් තුර්කිවරුන් විසින් අධික මිලක් යටතේ පෙරදිග භාණ්ඩ අලෙවි කිරීම, පෘතුගීසීන් පෙරදිග ගවේෂණය සඳහා යොමු කර ලීමට බලපෑ ප්‍රධාන හේතුව වශයෙන් හඳුනා ගත හැකිය.නමුත් ඒ වන විටද පෙරදිග ප්‍රදේශවල වෙළඳ බලය ව්‍යාප්ත කිරීමේදි එහි වෙළඳ බලය අත්කරගෙන සිටි මුස්ලිම්වරුන්ගේ වෙළඳ නැව් කීපයක් හඹා ගිය පෘතුගීසි නාවික කණ්ඩායමක් කුණාටුවකට හසුව අහඹු ලෙස ලංකාවට ගොඩබැසීඹ ලංකා ඉතිහාසයේ සන්ධිස්ථානයකි.වර්ෂ 1505 දී මෙරටට පැමිණි පෘතුගීසීන් විසින් තම වෙළඳ ආධිපත්‍ය පිහිටුවා ගැනීමේ පරමාර්ථය ඇතිව කටයුතු කරන ලදි.එසේ පැමිණි පෘතුගීසින් කෝට්ටේ රාජධානියට ආරක්ෂාව සැපයීමට ද කටයුතු කරන අතර කන්ද උඩරටට එරෙහිව ගෙන යන සටනේ ආරක්ෂක ස්ථානයක් ලෙස මැණික්කඩවර බලකොටුව ලංකාවේ පළමු පෘතුගීසි ආරක්ෂක ස්ථානය ලෙස හඳුනා ගත හැකිය.සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොළ උප දිසාපති කොට්ඨාසයේ නැතහොත් සතර කෝරළයට අයත් බෙලිගල් කෝරළයේ ,කීරවැලි පත්තුව නැගෙනහිර කොටසේ මැණික්කඩවර ග්‍රාමය මධ්‍යයට වන්නට බලකොටු භූමිය පිහිටා ඇත.භූ විෂමතාව සාමාන්‍ය ප්‍රමාණයේ උන්නතාංශ මට්ටමකින් යුතු කඳු වළල්ලකින් වටවුන ද්‍රෝණියක් වැනි තැනිතලා භූමියක පිහිටා ඇත.එම කඳු අතර දොරවක කඳුවැටිය,ගුරුවල කඳුවැටිය ප්‍රධාන වේ.IX වන ධර්ම පරාක්‍රමබාහු (1505-1527) රජුගේ මල්බෑයන් වූ ශ්‍රී රාජසිංහ හා විජයබාහු විසින් මැණික්කඩවර නුවර ගොඩනගන ලදැයි පැවසේ.(බෙල් 2004 : 54).

මැණික්කඩවර පිහිටුවන ලද පෘතුගීසි බලකොටුව පිළිබඳ අධ්‍යනය කිරීම අරමුණු කරගත් මෙම පර්යේෂණයේ දි පර්යේෂණ ගැටලුව බවට පත් වූයේ මෙවැනි බලකොටුවක් පිහිටුවන්නට කිනම් අන්දමේ හේතු සාධක බලපාන්නට ඇත් ද යන්න හා එහි පැවැති ක්‍රියාකාරිත්වය කෙසේ පැවතියේ ද යන්න සොයා බැලීමයි.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණය යන ක්‍රමවේද ද්විත්තයම භාවිතා කරන ලදි.මූලිකවම ක්ෂේත්‍රය හඳුනා ගැනීම සඳහා මුලින්ම සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යනය කරන ලදි.ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස එච්.සි.පි.බෙල් මහතාගේ කෑගලු වාර්තාව අධ්‍යනය කරන ලදි.මීට අමතරව සබරගමු වංශය ,යන මූලාශ්‍ර මූලික වශයෙන් පරිශීලනය කරනු ලැබීය.මීට අමතරව

අන්තර්ජාල මූලාශ්‍ර ඇසුරින් ද මෙම පර්යේෂණය සඳහා තොරතුරු එක් රැස් කරගන්නා ලදි.මීට අමතරව ක්ෂේත්‍ර ගවේෂණය ඔස්සේ බලකොටුව පැවති ස්ථානය නිරීක්ෂණය කිරිමත් සිදු කරන ලදි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

දැදිගම සිට කිලෝමීටර් දෙක හමාරක් ඔබ්බෙන් හොලොම්බුව සහ මැණික්කඩවර යන ග්‍රාමය පිහිටා තිබේ.ලන්දේසින්ට පමණක් නොව පසුව බ්‍රිතාන්‍යයන්ට පවා යම් සේ සීතාවක වැදගත් වුයේ ද,පෘතුගීසින්ට මැණික්කඩවර ඊටත් වැඩි ලෙස වැදගත් වු බව පෙන්වා දිය හැකිය.විශේෂයෙන් එය මහනුවර රාජධානිය තුළ ඔවුන්ගේ ආරක්ෂාව සැලසු ප්‍රධාන කඳවුර විය.මැණික්කඩවර වටකොට ඇති අභිමානවත් ගිරිශිඛර වලට රිසි කරමින් කඳු වලට මැදි වූ තැනිතලාවක කඳවුරක් පිහිටුවා ගැනිමට දක්ෂ සොල්දාදුවකු වු ජෙරනිමෝද අසවේදු පෙළඹී ඇති බව පැහැදිලි වේ.ඔහුගේ කඳවුර සිංහල හමුදාව විසින් විනාශ කර දැමීමට අපහසු ස්ථානයක් වශයෙන් පැහැදිලි වේ.'අප විසින් විස්තර කොට ඇති සත්කෝරළයේ ජයග්‍රහණ ලබා ගැනීමෙන් හා සතුරන්ගේ දඩුවැට විනාශ කිරීමෙන් අනතුරුව මැණික්කඩවරට යවා එහි ආරක්ෂක කොටුවක් ඉදිකිරිමට ඩි.ජෙරනිමෝද අසවේදු ජනරාල්වරයා තිරණය කළේය.ඒ එය කන්ද උඩරට රාජධානියට බෙහෙවින් සමීප වු හෙයින් එහි සිට එය දිනා ගැනීමට හැකි වනු පිණිසය.එසේම සතරකෝරළයට සමීප ආරක්ෂක හමුදා සහිත බලකොටුවක් සේ භාවිතා කළ හැකි වන පරිදි ඒ ආරක්ෂක කොටුවෙහි (දඩුවැට යෙදු ස්ථානයෙහි) යුද්ධායුධ ගබඩාවක් හා හේවා මඩමක් ඉදි කිරිමේ අරමුණින් ද වේ.'(බෙල් 2004 :57).

පෘතුගීසින් විසින් පළමු වරට ආරක්ෂක ස්ථානයක් ලෙස මැණික්කඩවර භාවිතයට ගන්නා ලද්දේ 1598 දීය.විෂ්කම්භය කිලෝ මීටර් දෙකහමාරක් පමණ වූ මණ්ඩල මාලයක් වන සේ කඳු පේළි මගින් ඇතුල් විය හැකි හැම කපොල්ලකම මුරපොළවල් ඉදි කොට ක්ෂණික ප්‍රහාර දියත් කිරීමට හැකි පරිදි අවිආයුධ සන්නද්ධ කොට පැවති බවට තොරතුරු හමුවේ.ක්ෂේත්‍රය නිරීක්ෂණය කිරීමෙන් පැහැදිළි වන්නේ පරිබාවන් ඇතුළත වු භූමිභාග වලින් ඒවායේ සොල්දාදුවන් 300 සිට 400 දක්වා වූ සංඛ්‍යාවක් නවත්වා නොගත් බවයි.බලකොටුවෙහි රඳවනු ලබන සෙබළුන්ගේ සුරක්ෂිතතාවට මෙන් ම ආරක්ෂා සංවිධාන කටයුතු වලට ද වඩාත් යහපත් කරවනු පිණිස පැවති තොටු පවුර ගලින් බැඳීමට තීරණය කළ අතර එය සෙබළුන් විසින්ම ශ්‍රමය වැය කරමින් මාස හතරක කාල සීමාවක් තුළ ගොඩනැගු අතර එය දිවයින මුළුල්ලේම පවත්නා බිඳ හෙළිය නොහැකි (එකම) බළකොටුව සේ පෙන්වා දිය හැකි ය.කන්ද උඩරට රාජධානියට බෙහෙවින් ආසන්න වු මැණික්කඩවර ශක්තිමත් බලකොටුවක් ලෙස ඉදිකරමින් කඳවුරු සියල්ලට ම ප්‍රධානියා වු තෝමේ කෝල්හෝ ද,ජෙයාඩ් සෙරායෝ ද යන කපිතාන්වරුන් යටතේ වු භට කණ්ඩායම් තුනක් ද සහිතව බෝහෝ දින ගණනාවකට ප්‍රමාණවත් ආහාර,වෙඩි බෙහෙත් ඇතුළු යුධ උපකරණ ආදිය ද සපයා සුරක්ෂිත කොට තැනු බවට පැහැදිලි වේ.(බෙල් 2004:56).

බලකොටුව සිව්දෙසට අට්ටාල සතරක් තබා මුළුමනින්ම මැට්ටෙන් තනන ලද්දකි.ගැඹුරුම ප්‍රපාතය අඩි 30කි.කාලතුවක්කු වලින් වෙඩි සැර නිකුත් කිරිමට යොදාගත් ප්‍රහාර විවර පිළිබඳ ලකුණු වාර්තා නොවේ.දකුණු අට්ටාලය විසින් එහි මධ්‍යය දක්වා ආරක්ෂක අගලක් කපා ඇත.හිස්ව පවතින මෙහි ගල් හෝ ගඩොල් නැත.උස් වු ගොඩැලි පමණක් දක්නට ලැබේ.බලකොටුව මධ්‍යයට වන්නට එකම ගොඩනැගිල්ල ගඩොලින් හා දැවයෙන් නිම කොට

තිබෙන්නට ඇත.එහි මධ්‍යයයේ දිගින් හා පළලින් අඩි 16×15ක් වූද ,ගැඹුරින් අඩි 3 ක් වූද, කුටියක් හෝ යුද්ධායුධ ගබඩාවක් හෝ පැවති බව නියත වශයෙන් ම කැණීම් වලින් හෙළි වී ඇති බව පැහැදිලි වේ.එහි අඟුරු තොගයක් හා පිළිවෙළින් අඟල් 13 1/2 ක් ,අඟල් 11 සහ අඟල් 10 යන වට ප්‍රමාණයෙන් යුතු ප්‍රමාණ තුනකින් වූ ගල් උණ්ඩ 100ක් පමණ ද සොයා ගෙන තිබේ.ප්‍රමාණයෙන් අඩි 4×අඩි 3 අඟල් 6 × අඟල් 8 ක් වූ මෙය ගල් පෝරුවක් යාබද විහාර භූමියෙන් සොයා ගෙන තිබේ.එහි එකල පැවති පෘතුගීසි රාජකීය ලාංඡනය නොගැමුරු උන්නත කැටයමින් නෙළා ඇත.කෙසේ වෙතත් 1598 දි මෙය පිහිටුවීමෙන් පසු වසර තිහක් පුරාවට අක්‍රමිකව පැවති යුද්ධයේ දි කන්ද උඩරට වැසියන් විසින් මෙය විනාශ කළ විය හැකි බවට මූලාශ්‍රගත අධ්‍යනයන් මඟින් පෙන්වා දිය හැක.(බෙල් 2004:56).

## ආශ්‍රිත ග්‍රන්ථ


පෙරේරා පියතුමා, එස්.ජී. (1963) ***ලංකා ඉතිහාසය-පෘතුගිසි යුගය,*** හේවාවසම්, පි.බී.ජේ.(අනු), සී/ස එක්සත් ප්‍රවෘත්ති සමාගම, කොළඹ.

බෙල්, එච්.සී.පි. (2004) ***සබරගමු පළාතේ-කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳ වාර්තාව,*** පරි කොත්මලේ එඩ්මන්. කේ.බී.ඒ.පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. කොළඹ.